**ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව**

**පුත්තලම දිස්ත්‍රික්කය**

**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-----------------------

සභාවේ ආදායම් හා වියදම් උපචිත පදනම මත ගිණුම්ගත කරන බවට අනාවරණය කර තිබුණද, පොල බදු ආදායම් මුදල් පදනම මත ගිණුම් ගත කර තිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ ) පසුගිය වර්ෂයට අදාල රු.2,000,000 ක් වූ සේවක වැටුප් ප්‍රතිපූර්ණ සමුච්චිත අරමුදලට බැර නොකර සමාලෝචිත වර්ෂයේ ආදායම් ආධාර ලෙස දක්වා තිබුණි.

(ආ ) සභාවේ ස්ථිර සේවකයින් වෙනුවෙන් ලැබිය යුතු රු.711,742 ක වැටුප් ප්‍රතිපූර්ණ ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ ) සභාව සතු ඉඩම් සහ දේපළ බාහිර පාර්ශ්වයකට පැවරීමෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු.2,380,000 ක් වූ ප්‍රාග්ධන ආදායම්, පුනරාවර්තන ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) දැයට කිරුල වැඩසටහන යටතේ ඉදිකර සභාවට පවරා දී තිබූ රු.450,000 ක් වූ විජය කටුපොත සතිපොල සභාවේ වත්කමක් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

## 1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

----------------------------------------------------

ණය ලිපිගොනු සහ අත්තිකාරම් ගෙවීම් විස්තර ඉදිරිපත් නොකිරීම නිසා පිළිවෙලින් රු.275,585 ක් හා රු.280,000 ක් වූ සේවක ණය සහ අත්තිකාරම් යන ගිණුම් විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 1.3.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

--------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති | | |
| (i) 5 (3) රීතිය | 37,191,866 | ආදායම් රැස් කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. |
| (ii) 5 (6) රීතිය | 76,992,518 | වගකිව යුතු නිලධාරීන් විසින් නියමිත කාල සීමාව තුල ප්‍රාදේශීය සභාව වෙත අයවිය යුතු සියලු ආදායම් හා වෙනත් ගාස්තු එකතු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) 5 (7) රීතිය | - | මුල්‍ය හා ගබඩා ගනුදෙනු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. |
| (iv) 218 රීතිය | 91,793,638 | සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක්ම සමීක්ෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1645 | - | පාවිච්චි කරන සියළුම වාහනවල දෛනික ධාවන සටහන්/යන්ත්‍ර පැය සටහන් විගණකාධිපති වෙත එවා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,054,473 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,040,231 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

------------------------

### 2.2.1 ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 වර්ෂය | | | | 2016 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 3,562 | 6,365 | 4,293 | 10,744 | 2,749 | 2,965 | 4,198 | 8,672 |
| කුලී | 5,133 | 8,327 | 8,587 | 4,738 | 2,759 | 6,765 | 8,329 | 4,998 |
| බලපත්‍ර ගාස්තු | 1,170 | 1,554 | 1,554 | - | 400 | 854 | 854 | - |
| වෙනත් ආදායම් | 48,367 | 47,575 | 53,100 | 35,460 | 42,127 | 47,537 | 12,043 | 40,994 |

සටහන: රැස්කළ ආදායම තුල වර්ෂයට බිල්කල ආදායමෙන් එකතු කිරීම් සහ පසුගිය වර්ෂවල හිඟහිටි ආදායමෙන් එකතු කිරීම් ඇතුළත් වේ.

**2.2.2** **ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය**

**----------------------------------------**

2017 ජනවාරි 01 දිනට රු.53,100,000 ක් වූ මුළු හිඟ ආදායමින් සමාලෝචිත වර්ෂය තුල රැස්කරගෙන තිබුණේ රු.13,847,875 ක් හෙවත් සියයට 34 ක් පමණි. සමාලෝචිත වර්ෂයේ බිල්කල ආදායමෙන් සියයට 84 ක් රැස්කරගෙන තිබුණි.

**2.2.3** **වරිපනම් හා බදු**

**-------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ ) සමාලෝචිත වර්ෂයට රු.6,124,514 ක් වූ බිල්කල වරිපනම් වලින් රු.2,080,712 ක් පමණක් රැස්කර තිබූ අතර එය බිල්කල ආදායමින් සියයට 34 ක් විය.

(ආ ) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.7,772,484 ක් වූ හිඟ වරිපනම්වලින් රු.1,854,662 ක් පමණක් රැස්කර තිබූ අතර එය සියයට 24 ක් විය.

**2.2.4** **කුලී**

**-------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.2,359,714 ක් වූ හිඟ බදු කුලී වලින් රු.1,975,201 ක් 2002 සිට 2015 වර්ෂය දක්වා වූ කාලයට අදාල විය.

(ආ) ආරච්චිකට්ටුව කඩ කාමර දෙකකින් අයවිය යුතු හිඟ කඩකුලිය වූ රු.254,054 ක් වර්ෂ 11 ක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.5** **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ රු.29,066,067 ක් වූ මුද්දර ගාස්තුවලින් රු.10,479,783 ක් වසර 5ක් තුල ඉල්ලීම් නොකිරීම හේතුවෙන් අයකරගත නොහැකි තත්ත්වයකට පත්ව තිබුණි. තවද, 2015,2016 සහ 2017 වර්ෂ සඳහා මුද්දර ගාස්තුවල ඇස්තමේන්තු වටිනාකම් ගිණුම්ගත කර තිබුණි.

(ආ) පළාත් ප්‍රධාන ලේකම්ගෙන් 2017 දෙසම්බර් 31 දිනට ලැබිය යුතු රු.7,481,057 ක උසාවි දඩවලින් රු.2,472,434 ක් වසර 05 ක් තුල ඉල්ලීම් නොකිරීම හේතුවෙන් අයකර ගත නොහැකි තත්ත්වයට පත් වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කාර්යසාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකලයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ 2017 දෙසැම්බර් 31 දින වන විට කාරණා 08 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ ) ක්‍රියාත්මක නොකල කර්තව්‍යන්

---------------------------------

පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සභාව විසින් ඉටුකල යුතුව තිබුණ කර්තව්‍යන් අනුව 2017 දෙසැම්බර් 31 දිනට සෞඛ්‍ය අංශයේ වැඩසටහන් 03 ක්, ජල සේවා අංශයේ වැඩ සටහන් 06 ක්, ප්‍රජා සංවර්ධන අංශයේ වැඩ සටහන් 03 ක් සහ පරිසර අංශයේ වැඩ සටහන් 02 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) කර්තව්‍යන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

------------------------------------

2017 දෙසැම්බර් 31 දිනට වූ ප්‍රගති වාර්තාව අනුව වැඩසටහන් 03 ක් නිම කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

සභාව දිනකට ටොන් 4 ක පමණ කසළ ප්‍රමාණයක් රැස් කරන අතර, එම කසළ විධිමත්ව බැහැර කිරීම සඳහා ස්ථිර වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට සභාව අපොහොසත් වී තිබුණි. දෛනිකව එකතු කරන කසළ පුද්ගලික ඉඩමකට අවිධිමත් ලෙස බැහැර කරමින් පැවතුණි.

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක -

-----------------------------

සභාව තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 සම්බන්ධව දැනුවත් වී තිබුණද එහි අරමුණු ළඟාකර ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පළාත් පාලන ගම්මාන සංවර්ධන වැඩසටහන යටතේ දිළිඳු පවුල් අතර බෙදා හැරීම සඳහා 2014 වර්ෂයේදී රු.149,100 ක් ගෙවා මිලදී ගෙන තිබූ සෙවිලි තහඩු 24 ක් සුදුසු ප්‍රතිලාභීන් වෙත බෙදා නොදී තහඩුවලින් කොටසක් යොදාගෙන කාර්ය මණ්ඩලය සඳහා වාහන අංගනයක් ඉදිකර තිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

(අ) අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

-------------------------------------

ආදායම් පරීක්ෂක තනතුරු 04 ක කාර්යයන් මාර්ග කම්කරුවන් විසින් ආවරණය කරමින් සිටි අතර සේවයේ යෙදී සිටි පුස්තකාල භාරකරුවන් තිදෙනෙකු සහ වාහන රියදුරන් 08 දෙනෙක් සඳහා අනුමැතිය ලැබී නොතිබුණි.

(ආ) සේවක ණය

--------------

ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 39 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.185,875 ක් වූ ණය ශේෂ වර්ෂ 10 කට වැඩි කාලයක සිට හිඟව පවතින අතර ඒවා අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

--------------------------------------

## 4.1 අයවැය පාලනය

-------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ ඇතුළත් වැය විෂයයන් 5 ක ප්‍රතිපාදන සියයට 100 ක් ඉතිරි වී තිබුණි. වැය විෂයයන් 29 ක ඉතිරිය සියයට 18 සිට සියයට 97 අතර පරාසයක් ගෙන තිබූ අතර, එහි එකතුව රු.3,162,135ක් විය. එසේම වැය විෂයයන් 10ක ප්‍රතිපාදන ඉක්මවා වියදම් කර තිබුණි.

## 4.2 අභ්‍යන්තර විගණනය

-----------------------

සමාලෝචිත වර්ෂයට අදාලව සභාවේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 4.3 පිළිතුරු නොදුන් විගණන විමසුම්

------------------------------------

2017 වර්ෂයේදී නිකුත්කර තිබූ විගණන විමසුමකට 2018 සැප්තැම්බර් 28 දිනට පෙර පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| (අ) ස්ථාවර වත්කම් | ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණ පවත්වා නොතිබීම. |
| (ආ) ණය ගැතියෝ | ණයගැතියන් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ පිළියෙල කර නොතිබීම සහ දිගු කාලීන වශයෙන් හිඟව පවතින ණය ශේෂ අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) සේවක ණය | ස්ථාන මාරු වී ගිය නිළධාරීන්ගේ ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු නොකිරීම |
| (ඈ) ආදායම් පාලනය | හිඟ වරිපනම් බදු, බදු කුලී, කඩ කුලී, මුද්දර ගාස්තු, උසාවි දඩ යනාදී ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කර නොතිබීම |